සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# පෙරදිග සංගීතය

6 ශ්‍රේණිය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සංගීතයේ මාධ්‍යය ලෙස හඳුන්වන්නේ,
(1) භාෂාව (2) අභිනය (3) නාදය (4) අංගචලනය

02 සරිගම, රිගමප, ........... යන ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදන ස්වර ඛණ්ඩය වන්නේ,
(1) ගමගප (2) ගමපධ (3) ගරිගම (4) ගරිගප

03 ඔබ වේ අප ශක්තී - අප හද තුළ භක්තී යනුවෙන් සඳහන් වන්නේ,
(1) පාසල් ගීයේ පද කොටසකි. (2) ජාතික ගීයේ පද කොටසකි.
(3) බැති ගීයක පද කොටසකි. (4) සරල ගීතයක ඇතුළත් කොටසකි.

04 අළුවෙන් හෙවත් Bow එකෙන් වාදනය කරන සංගීත භාණ්ඩයක් වන්නේ,
(1) ගිටාරය (2) වයලීනය (3) සිතාරය (4) මැණ්ඩලීනය

05 ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ,
(1) ඩබ්. ඩී. අමරදේව මහතා විසිනි. (2) සුනිල් ශාන්ත මහතා විසිනි.
(3) ආනන්ද සමරකෝන් මහතා විසිනි. (4) මහගම සේකර මහතා විසිනි.

- අංක 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | | |
|---|---|---|
| 06 | සුවඳ පද්ම ඕලු ආදි | • ළමා ගීයකි |
| 07 | මෙම ගිම්හාන | • ඉන්දීය ජාතික ගීය |
| 08 | අද වෙස්සන්තර රාජ පුතා | • වෙස්සන්තර නූර්තිය |
| 09 | ජන ගන මන අධිනායක | • දුටුගැමුණු නූර්තිය |
| 10 | සෙන්පතියන් ගැන | • විදුර නූර්තිය |

- අංක 11 - 15 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

11 බටනලාව සුෂිර භාණ්ඩ වර්ගයට අයත් ය. ( )
12 වයලීනය තත් භාණ්ඩයකි. ( )
13 ගිටාරය වාදනය කරන්නේ මිස්රාබය ආධාරයෙනි. ( )
14 මේ වැල මොකදෝ ගීතය මේවර කෙළියේ එන ගීතයකි. ( )
15 සරිගමපධනි යනු ස්වර අෂ්ඨකයයි. ( )

- **අංක 16 - 20 දක්වා සුදුසු පදය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(පාසල් ගීතය / ඔළිඳ කෙළිය / ස්වර ස්ථාපන ගී / තබ්ලාව / සර්පිනාව)

16 ...................................... කාන්තාවන්ට ආවේණික ක්‍රීඩාවකි.

17 කඳුපෙළ අතරේ යන ගීතය ...................................... ගණයට අයත්වේ.

18 ...................................... අවනද්ධ ගණයට අයත් භාණ්ඩයකි.

19 පාසලේ අභිමානය ගැන කියවෙන්නේ ............................... තුළිනි.

20 .................................................. ස්වර පුවරු සංගීත භාණ්ඩයකි. (ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (i) පන්ති කාමරයේ දී ඔබ ස්වසන අභ්‍යාසයක් පුහුණු වූ ආකාරය විස්තර කරන්න. (ල. 03)

(ii) ළමා ගීත 2 ක මුල් පද 2 ක් ලියන්න. (ල. 02)

(iii) ඔබ උගත් ස්වර ස්ථාපන ගීයක් ලියන්න. (ල. 05)

02 (i) ඔබ උගත් ජන ක්‍රීඩා හා සම්බන්ධ ගීතයක් ලියන්න. (ල. 05)

(ii) ජන ක්‍රීඩා තුළින් ලබාගත හැකි ආදර්ශ 3 ක් ලියන්න. (ල. 03)

(iii) වෙනත් ජනක්‍රීඩා 2 ක් නම් කරන්න. (ල. 02)

03 (i) තත් වාද්‍ය භාණ්ඩ 3 ක් නම් කරන්න. (ල. 03)

(ii) තාල වාද්‍ය භාණ්ඩ 2 ක නම් ලියන්න. (ල. 02)

(iii) ඔබ කැමති සංගීත භාණ්ඩයක රූප සටහනක් ඇඳ ඒ පිළිබඳ කරුණු 3 ක් සඳහන් කරන්න. (ල. 05)

04 (i) ඔබ පන්තිකාමරයේ දී ගායනා කළ නුර්ති ගීතයක ස්ථායි කොටස ලියන්න. (ල. 05)

(ii) නූර්ති නාට්‍ය රචකයින් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ල. 02)

(iii) නූර්ති නාට්‍ය 3 ක නම් ලියන්න. (ල. 03)

05 (i) ස්වර පුවරු සංගීත භාණ්ඩයක රූප සටහනක් අඳින්න. (ල. 03)

(ii) එහි කෝමල <u>රි</u> <u>ග</u> <u>ධ</u> <u>නි</u> ස්වර ලකුණු කරන්න. (ල. 04)

(iii) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ 3 ක් නම් කරන්න. (ල. 03)

(ලකුණු 3 x 10 = 30)

## පිළිතුරු පත්‍රය - I කොටස

01 3 02 2 03 3 04 2 05 3 06 දුටුගැමුණු 07 විදුර නූර්තිය
08 වෙස්සන්තර නූර්තිය 09 ඉන්දීය ජාතික ගීතය 10 ළමා ගීතයකි 11 ✓
12 ✓ 13 × 14 × 15 ✓ 16 ඔළිඳ කෙළිය 17 ස්වර ස්ථාපන ගී
18 තබ්ලාව 19 පාසල් ගීතය 20 සර්පිනාව

(1 x 20 = 20)

## II කොටස

01 (i) ප්‍රශ්නයට අදාළව පිළිතුරු සපයා ඇත්නම් ලකුණු පිරිනමන්න. (ල. 03)
(ii) ළමා ගීත දෙකක මුල් පාද 2 ක බැගින් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 02)
(iii) නිවැරදිව ස්වර ස්ථාපන ගීත ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)

02 (i) එළුවන්කැම, මේවර කෙළිය, ඔළිඳ කෙළිය, කළගෙඩි සෙල්ලම යන ක්‍රීඩාවලට අයත් ගීත ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)
(ii) එකමුතුකම, සුහදතාවය වර්ධනය හා සාමූහිකත්වය වර්ධනය කරන ගීත විශේෂයකි. (ල. 03)
(iii) ලී කෙළි, හවරි හැංගීම, පනා හැංගීම ආදී ඕනෑම ජන ක්‍රීඩා 2 ක් නම් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 02)

03 (i) වයලීනය, ගිටාරය, සිතාරය, එස්රාජය, මැන්ඩලීනය යන භාණ්ඩවලින් භාණ්ඩ 3 ක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)
(ii) තබ්ලාව, රබාන, ගැටබෙරය, පහතරට බෙරය.... ආදී වශයෙන් තාල තැබිය හැකි ඕනෑම භාණ්ඩයක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 02)
(iii) උචිත රූප සටහනක් ඇඳ කොටස් 3 ක් නම්කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)

04 (i) පන්ති කාමරයේ දී ගායනා කළ නූර්ති ගීතයක ස්ථායි කොටස ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)
(ii) නීතිඥ ජෝන් ද සිල්වා / චාල්ස් ඩයස් (ල. 02)
(iii) වෙස්සන්තර නූර්ති / දුටුගැමුණු නූර්ති / විදුර නූර්ති / සිරිසඟබෝ නූර්ති / රාමායණය / පද්මාවතී ආදී වශයෙන් නූර්ති 3 ක් නම්කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 03)

05 (i) ස්වර පුවරු සංගීත භාණ්ඩයක රූප සටහනක් ඇඳ ඇත්නම් ලකුණු දෙන්න. (ල. 03)
(ii) රි , ග , ධ , නි ස්වර නියමිත ස්ථානවල ලකුණු කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 04)
(iii) සර්පිනාව, මෙලෝඩිකාව, පියානෝව, ඕගනය, එකෝඩියනය යන භාණ්ඩ අතරින් 3 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 03)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**6 ශ්‍රේණිය**

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

01 ඔබ කැමති ස්වර ස්ථාපන ගීතයක් ගයන්න. (ලකුණු 10)

02 නැමති නූර්ති ගිතයක් ගයන්න. (ලකුණු 10)

03 කෙළි ගීතයක් ගායනය කරන්න. (ලකුණු 10)

04 ඔබ කැමති ස්වර අභ්‍යාසයක් ගයන්න. (ලකුණු 10)

05 ඔබ කැමති සංගීත භාණ්ඩයකින් ස්වර සප්තකය වාදනය කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 50)